# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.12.08 පැය 1410 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 2787/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**2025.12.07 වන දින සවස 04.00 ට කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මඟින් ඉදිරි පැය 36 ක කාලයක් සඳහා නිකුත් කරන ලද සාමාන්‍ය කාලගුණ අනාවැකිය සහ පූර්ව අනතුරු ඇඟවීමේ නිවේදනය සම්බන්ධව.**

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් පූර්ව අනතුරු ඇඟවීමේ නිවේදනයක් සහ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මඟින් කාලගුණ අනාවැකිය සම්බන්ධ නිවේදනය නිකුත් කර ඇත. ඒ අනුව, දිවයින හරහා ඊසානදිග මෝසම් තත්ත්වය ක්‍රමයෙන් ස්ථාපිත වෙමින් පවතින බවට සඳහන් කර ඇත. තවද එම නිවේදනයේ පහත පරිදි සඳහන් කර ඇත.

- ❖ උතුර, උතුරු මැද, නැගෙනහිර සහ ඌව පළාත් වල විටින්විට වැසි ඇති වේ. මඩකලපුව දිස්ත්‍රික්කයේ ඇතැම් ස්ථාන වලට මි.මී. 75 ක පමණ තරමක තද වැසි ඇතිවිය හැකිය.
- ❖ දිවයිනේ සෙසු ප්‍රදේශ වල පස්වරු කාලයේ තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති විය හැකිය.
- ❖ බස්නාහිර, සබරගමුව, මධ්‍යම සහ ඌව පළාත් වල ඇතැම් ස්ථාන වල අළුයම් කාලයේදී මීදුම් සහිත තත්ත්වයක් පැවතිය හැකිය.

එබැවින් මෙම ප්‍රදේශ වල ජනතාව හට ලද සුළං වලින් හා අකුණු වලින් සිදුවිය හැකි අනතුරු අවම කර ගැනීමට විමසිලිමත්ව කටයුතු කරන මෙන් පොලිසිය මහජනතාවගෙන් ඉල්ලා සිටින අතර මේ සම්බන්ධයෙන් ආපදා කළමණාකරන මධ්‍යස්ථානයේ 117 දුරකථන අංකය හා සම්බන්ධ වී වැඩිදුරටත් තොරතුරු දැන ගැනීමේ හැකියාව ඇත.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**